# 2023.01.05 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීම් වාර්තාව.

2023 ක් වූ ජනවාරි මස 05 වන දින පෙ.ව 10.00 ට පමණ ගරු සභාපති ආනන්ද වීරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් කඹුරුපිටිය ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. | ගරු ප්‍රාදේශීය සභා සභාපති | - ආනන්ද වීරසිංහ මහතා |
| 02. | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - දුමින්ද පුෂ්පකුමාර මහතා |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - රුචිර යකල්ලේආරච්චි මහතා |
| | ලේකම් | - නාලිකා අබේකෝන් මහත්මිය |

**නොපැමිණීම**

| | | |
|---|---|---|
| 01. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ප්‍රේමවංශ වර්ණකුල මහතා |
| 02. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - රෙජී වෙල්ලප්පිලි මහතා |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - මනෝරි සමරවික්‍රම මිය |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - නලින් නරසිංහ මහතා |

ගරු ප්‍රාදේශීය සභා සභාපති ආනන්ද වීරසිංහ මහතා විසින් අද දින නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා සහ නිලධාරීන් ගෞරවයෙන් පිළිගන්නා ලදී. ඉන්පසුව පසුගිය කමිටුවේ නිර්දේශ කරන ලද කරුණු පිළිබඳව ප්‍රගතිය සාකච්ඡා කරන ලදී.

01. පසුගිය කමිටුවේදී පළාත් පාලන කොමසාරිස්ගේ අංක MR/ACLG/DEV/04/ඉඩම්/පොදු හා 2022.11.28 දිනැති ලිපිය අනුව ඉඩම් මැනුම් කටයුතු කිරීම සඳහා මිනිම්දෝරු කාර්යාලයට ඉඩම් 08 ක් යොමු කිරීමට තිරණය කල අතර, එම ඉඩම් මැනුම් කටයුතු කිරීම සඳහා මිනින්දෝරු ලෙපාර්තමේන්තුවට යොමු කල පසු එම ආයතනය විසින් එම ඉඩම් මැනිය නොහැකි බවත් ප්‍රාදේශිය සභාව විසින් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අධික්ෂණය යටතේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවකු ලවා මැනුම් කටයුතු

සිදු කරගන්නා ලෙස දන්වා ඇති බව විෂය භාර නිලධාරි විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදි.

02 .ප්‍රාදේශිය සාහිත්‍ය උළෙල හා ජාතික කියවීමේ මාසය වෙනුවෙන් පවත්වන ලැබු තරඟ සඳහා ත්‍යාග ප්‍රදානොත්සවය 2023 පෙබරවාරි මස 22 බදාදා දින පැවැත්වීමට කටයුතු සංවිධානය කිරිම සුදුසු බව කමිටුව ඒකමතිකව නිර්දේශ කරන ලදි.

03. පුස්තකාලායාධිපති එස්.පි.සදීරා සන්දිපනි මිය විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද ලිපියට පුස්තකාලයේ අංශ වෙන් කිරිමේ පුවරු ත්‍රෛභාෂාවෙන් මුද්‍රණය කර සවි කිරිම සුදුසු බව කමිටුව ඒකමතිකව නිර්දේශ කරන ලදි.

04.ප්‍රාදේශිය සභා මන්ත්‍රි රුචිර යකල්ලේ ආරච්චි මහතාගේ ඉල්ලීම අනුව ප්‍රාදේශිය සභා පෙර පාසල් ගොඩනැගිල්ලෙහි ටයිල් ඇල්ලීමටත්, පෙර පාසලට බාත්රූම් එකක් ඉදිකිරිම සුදුසු බවත් එමෙන්ම කද්දුව පුස්තකාලයේ සහ පෙර පාසල වටේ ආරක්ෂක වැට සකස් කිරිම සුදුසු බවත් කමිටුව ඒකමතිකව නිර්දේශ කරන ලදි.

අද දිනට නියමිත වැඩ කටයුතු අවසන් බැවින් පැමිණි සියලු දෙනාට ගරු සභාපතිතුමා විසින් ස්තුති කරමින් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

ආනන්ද වීරසිංහ,
කමිටු සභාපති,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.